# බළන්ගොඩ නගර සභාව

## 2026.02.25 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2026.02.25**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 3.ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී පේමදාස මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9.ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01.පසුගිය 2026.01.06 දිනැති මහ සභාවේ සහ 2026.01.26 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2026-01-06 දිනැති මහා සභා වාර්තාව සහ 2026-01-26 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් 2026-01-06 දිනැති මහා සභා වාර්තාව සහ 2026-01-26 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභා වාර්තාවල සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවුනු බැවින් **2026-01-06 දිනැති මහ සභාවේ සහ 2026-01-26 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ❖ ගරු සභාපතිතුමන් විසින් නිවේදන වාරය ආරම්භ කරමින් පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සභාවේ ගරු නාගරික මන්ත්‍රී කණ්ඩායම සමඟ ඉතා හදිසි කාරණාවක් වෙනුවෙන් සාකච්ඡාවක් ඉල්ලුම් කළ බවත්, ඒ අනුව 2026-02-26 දින ප.ව.3.00 ට එම සාකච්ඡාව සඳහා එකඟතාව පළ කළ බැවින් එයට සහභාගී වන ලෙස ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය වෙත ආරාධනා කරන බවත්ය.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අසනීප තත්ත්වයක් හේතුවෙන් ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, 2026-02-25 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත් යොමු කරන ලද ඉල්ලීම අනුව ගරු සභාපතිතුමන් විසින් එතුමාගේ නිවාඩු අනුමත කරන ලෙසට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව එතුමාගේ නිවාඩුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

- දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට පත්වූ මහියංගණ බල ප්‍රදේශය සඳහා සහන සේවා සැපයීම වෙනුවෙන් ස්තූතිය පුද කරමින් මහියංගණ ප්‍රාදේශීය සභාව විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- බස් නැවතුම්පොළ පරිශ්‍රයේ අළුත්වැඩියා කරනු ලබන වැසිකිළි පද්ධතියේ අපද්‍රව්‍ය අදාළ කොන්ත්‍රාත්කරු විසින් බළන්ගොඩ නගරයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමට බැහැර කර ඇති බවත් එවැනි දේ සඳහා එම ඉඩම් භාවිතා නොකරන ලෙසත් දන්වමින් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂතුමිය යොමුකර ඇති දැනුවත් කිරීමේ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  අනතුරුව ගරු සභාපතිතුමන් පැවසූයේ එම බස් නැවතුම්පොළ අසළ නාගරික සංවර්ධන අධිකාරිය සතු භූමිය ඉදිරියේදී තාවකාලික බදු පදනම මත සභාවට ලබා ගැනීමට නියමිත බවත්, ඒ අනුව එම අධිකාරියේ දැනුවත් කිරීම පරිදි ක්ෂණිකව අදාළ කොන්ත්‍රාත්කරු දැනුවත් කළ බවත්ය.

- බළන්ගොඩ නව බස් නැවතුම්පොළ මැද පඩිපෙළ යට ඇති භාවිතයට නොගත් ඉඩ කොටස සන්නිවේදන සාප්පුවක් පවත්වාගෙන යාමට අවසර ලබා දෙන ලෙස ඉල්ලීම් කරමින් අංක 23, නගර සභා නිවාස, බොම්බුව,බළන්ගොඩ ලිපිනයේ පදිංචි චාමර රාජපක්ෂ යන අය යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පවසා සිටියේ ඉහත ඉල්ලීම් පිළිබඳව ඉල්ලීම යොමුකර ඇති මහතා තමන් සමඟද සාකච්ඡා කළ බවත්, එයින් එම පුද්ගලයා වෙත යම් රැකියා උත්පාදනයක් සිදුවන බැවින් ඒ පිළිබඳ සලකා බැලිය යුතු බවත්ය.ගරු සභාපතිතුමා පැවසූයේ මෙම ගොඩනැගිල්ලේ මූලික සැලැස්මට ඉහත ඉල්ලීම ගැලපෙනවද නැද්ද යන්න පිළිබඳව සොයා බලා ඉදිරි සභාවක් වෙත ඉදිරිපත් කළ යුතු බවයි.

  සභාව සතු දේපළක් එසේ පුද්ගලයන් ඉල්ලුම් කරන පමණින් ලබා දිය නොහැකි බවත්, දේපළ එසේ ලබාදෙන්නේ නම් එය විධිමත් ක්‍රමවේදයක් මත ලබා දිය යුතු බවත්, සභාව මඟින් තීරණ ගෙන අදාළ අනුමැතීන් ලබාගෙන ටෙන්ඩර් කිරීමෙන් ලබා දිය හැකි බවත්, එම පුද්ගලයා වෙත එම ස්ථානය ලබාදීමට විරුද්ධ වනවා නොව නිසි ක්‍රමවේදයක් මඟින් නීත්‍යානුකූල ලෙස

ලබාදීම කළ යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා කරුණු දක්වමින් පවසන ලදී.

අනතුරුව මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ ඉහත ඉල්ලීම තමන්ගේ ධූරකාලයේදීද කළ බවත්,ඉල්ලීම් කරනු ලබන්නේ බස් නැවතුම්පොළ පඩිපෙළක් යට ස්ථානයක් බවත්, මෙම ස්ථානය නිරීක්ෂණය කිරිමට කාර්මික නිලධාරී මහතා සමඟ සම්බන්ධ වූ බවත්, ඒ අනුව ඒ පිළිබඳව කාර්මික නිලධාරී මහතාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කරන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා එකී කාරක සභාව බවට පත් කිරීමේ යෝජනාව ස්ථිර කිරීමෙන් අනතුරුව මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඉහත කාරණය පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ එවැනි කාරණා වලදී එම පුද්ගලයා පවසන ආකාරයට ස්ථාන ලබා දීමක් මාසික කුලී තීරණය කිරීමක් සිදු නොකර සභාවෙන් ඉදිකර සභාවෙන් ටෙන්ඩර් ක්‍රමවේදය අනුගමනය කර නීත්‍යානුකූලව ලබා දීමක් කළ යුතු බවයි.ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පැවසූයේ එම ස්ථානය ටෙන්ඩර් කිරීමක් ආදිය සිදුකර ලබා දිය හැකි ස්ථානයක් නොවන බවත්, ලබා දීම නොදීම පිළිබඳ සභාවෙන් තීරණය කරන ලෙසත්, එම පුද්ගලයා තමන්ගෙන්ද ඉහත ඉල්ලීම සිදු කළ බවත්ය.

ඒ අනුව ඉහත ස්ථානය පිළිබඳ ස්ථානීය පරීක්ෂණයක් සිදුකර සක්‍යතාවය සලකා බලා ඉදිරි සභාවක් වෙත වාර්තා කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

- නිවසට ඇති අනතුරුදායක තත්වය වළක්වා ගැනීමට ඇති කම්බි වැටක් සම්බන්ධව අංක L/30 වෙට්නෝල් පාර,බැංකියවත්ත, තුඹගොඩ,බළන්ගොඩ ලිපිනයේ පදිංචි ආර්.ඇන්තනී කුමාර යන අය යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසූයේ මෙම ස්ථානය පිළිබඳ නිලධාරීන් යොමුකර ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත්, එකී ස්ථානයේ අනතුරුදායක තත්වයක්ද පවතින බවත්, මාර්ගයේ ගමන් කරන අයටද අවධානමක් බැවින් දැලක් ගැසීම වැනි නිර්දේශයක් ලබා දිය හැකි බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසූයේ එම කම්බි වැට ඉවත් කරන ලෙසට සභාවෙන් උපදෙස් ලබා දී ඇති බවත්,නමුත් එම පැමිණිල්ල යොමු කළ පාර්ශවයේ

නිවස තිබෙන්නේ පාරෙන් යට බවත්,සිදු කළ යුත්තේ බැම්මක් සභාවෙන් ඉදිකර දීම හෝ එම පාර්ශවයට බැම්මක් ඉදිකරගැනීමට උපදෙස් ලබා දීම බවත්, එම මිනිසුන් වෙනුවෙන් සාධාරණයක් කළයුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ මෙම නිවස නගර සභා සීමාවේ පිහිටි නිවසක් නොවන බවත්, ප්‍රාදේශීය සභාවට අයත් බවත්, එම පාර්ශවය නගර සභා මාර්ගයේ ඉවුර කපා ඇති බැවින් ඉවුර කඩා වැටීමේ අවධානම එවිට පවතින බවත්, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට යොමු කිරීම සුදුසු බවත්ය.ඒ අනුව ඉහත පැමිණිල්ල බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත යොමු කිරීමට සාකච්ඡා විය.

- විහාරස්ථානයේ සංඝාවාසයටත්,ධර්මශාලා ගොඩනැගිල්ලටත් අනතුරුදායකව පැවති ගස් කිහිපයක් ඉවත් කර දෙන ලෙස සිදුකළ ඉල්ලීම මත එම කටයුතු කඩිනමින් ඉටුකර දීම සම්බන්ධව විහාරස්ථ දායක සභාවේ පුණ්‍යානුමෝදනා පූර්වක ස්තූතිය පල කරන බව දන්වමින් ශ්‍රී සාංඝික මහා සුධර්මාරාම විහාහාරාධිපති, පූජ්‍ය අටවක්වෙල විජිතබෝධි නායක ස්වාමීන් වහන්සේ යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
  මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ මේ සම්බන්ධව මැදිහත්වී කටයුතු කලේ හිටපු ගරු සභාපති කේ.ජී පේමදාස මැතිතුමා බවත්, එතුමාට ස්තූතිය පල කරන බවත්ය.ගරු සභාපතිතුමාද පැවසුයේ එතුමා මේ සම්බන්ධව මැදිහත්වී කටයුතු කළ බවත්, එතුමාට ස්තූතිවන්ත වන බවත්ය.

- අංක 14 දරණ කඩ කාමරය වහලය උස්කොට අළුත්වැඩියා කර ගැනීම සඳහා අවසර ලබා දෙන ලෙස කාර් පාර්ක් අංක 14 කඩ කාමරයේ එම්.එන්.ඉලයාස් මොහොමඩ් යන අය යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.මේ සම්බන්ධව සියළුම කඩ සඳහා ඇති හැකියාව බලා ඉදිරි සභාවක් වෙත යොමු කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

මෙදිනට නියමිත ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

අනතුරුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ පහත සඳහන් තීරණ ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**05.01** 2026.03.01 සිට 2026.12.31 දක්වා බළන්ගොඩ නගරයේ මහජන පොළ පොදු වැසිකිළි පිරිසිදු කර පවත්වා ගෙන යාම සඳහා සුදුසු බදුකරුවන් තෝරාගැනීම වෙනුවෙන් ටෙන්ඩර්පත් විවෘත කිරීම.

2026.03.01 සිට 2026.12.31 දක්වා බළන්ගොඩ නගරයේ මහජන පොළ පොදු වැසිකිළි පිරිසිදු කර පවත්වා ගෙන යාම සඳහා සුදුසු බදුකරුවන් තෝරාගැනීම වෙනුවෙන් ටෙන්ඩර්පත් කැඳවීමේදී අයදුම්පත් 01ක් පමණක් නිකුත් වී තිබූ අතර පහත පරිදි ලංසු ඉදිරිපත් වී තිබිණි.

| ටෙන්ඩර්කරුගේ නම | ලංසු මුදල (රු.) |
|---|---|
| ආර්.කේ.ජයසුන්දර | 26,000.00 |

ඒ අනුව බළන්ගොඩ නගරයේ මහජන පොළ පොදු වැසිකිළිය පිරිසිදු කර ගාස්තු අයකරගෙන පවත්වා ගෙන යාම සඳහා ඉහත ටෙන්ඩර්කරු එකඟවීමත් සමඟ වෙනත් ලංසුකරුවෙකු ඉදිරිපත් වී නොමැති බැවින් ආර්.කේ.ජයසුන්දර මහතා වෙත රු.26,000ක මුදලකට ටෙන්ඩරය පිරිනැමීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. කල් දී ඇති ප්‍රශ්න

**06:01 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා**

**06:01:01** බළන්ගොඩ නගර සභා සීමාව තුල ස්ථාපිත නමුත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටියට නොයන ප්‍රචාරක පුවරු සංඛ්‍යාව කොපමණ ද? ඒවා පිහිටි ස්ථාන කවරේද? එම එක් එක් පුවරුවෙන් මසකට සභාව ලබන ආදායම වෙන වෙනම ඉදිරිපත් කරන්න.

ඉහත ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා ටෙන්ඩර් දැන්වීම් පුවරු සම්බන්ධව පහත විස්තරය ඉදිරිපත් කරන ලදී.

බළන්ගොඩ නගර සභාව සතුව ටෙන්ඩර් දැන්වීම් පුවරු - 10 ක්ද, ක්‍රිඩා පිටිය යාබද දැන්වීම් පුවරු - 15ක්ද පවතින බවත්, ගාස්තු ගෙවන දැන්වීම් පුවරු( පුද්ගලික ආයතන සවිකිර ඇති) - 08 ක් පවතින

බවත්, 2025 වර්ෂයේ දැන්වීම් පුවරු සමීක්ෂණයට අනුව හදුනාගත් දැන්වීම් පුවරුවල විස්තර පහත පරිදි වන බවත්ය.

| හදුනාගත් දැන්වීම් පුවරු සංඛ්‍යාව | ගාස්තු ගෙවන දැන්වීම් පුවරු සංඛ්‍යාව | ගාස්තු නොගෙවන දැන්වීම් පුවරු සංඛ්‍යාව | 2025 වසරට ලබාගත් දැන්වීම් පුවරු ගාස්තු (ස්ථිර දැන්වීම් පුවරු සඳහා) |
|---|---|---|---|
| 139 | 115 | 24 | රු. 2,718,495.00 |

**06:01:02** සභාවට ගාස්තු නොගෙවන ප්‍රචාරක පුවරු සම්බන්ධ විස්තරය සහ ඒ සඳහා ආදායම් අංශයේ ස්ථාවරත්වය කුමක් ද?

ඉහත ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා සභාවට ගාස්තු නොගෙවන ප්‍රචාරක දැන්වීම පුවරු පිළිබඳ විස්තරය සභාවට ඉදිරිපත් කරන ලද අතර ගාස්තු නොගෙවන දැන්වීම් පුවරු සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ලෙස ලිපි මගින් අදාළ ගාස්තු ගෙවන ලෙස දැනුවත් කර ඇති බවත්, විධිමත් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති බවත්, අනවසර අවිධිමත් තාවකාලික දැන්වීම් පුවරු සියල්ල ඉවත් කිරීම මාස්පතා සිදුකරන බවත් පවසන ලදී.

**06:02** **ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**06:02:01** බළන්ගොඩ බුලත්ගම සුසානභූමිය සම්බන්ධයෙන් පසුගිය සභාවට ඉදිරිපත් කළ අතර ඒ සම්බන්ධයෙන් දැනට පවතින තත්වය කුමක්ද?

ඉහත ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ සභාවට අයත් සුසාන භූමියක් වන බුලත්ගම සුසාන භූමියේ දැවමය වටිනාකමක් පවතින ගස් හැර ඉතිරි ගස් මේ වන විට ඉවත් කර ඇති බවත්, දැවමය වටිනාකමක් සහිත ගස් ඉවත් කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත දැනුම් දී ඇති බවත්, ඒ පිළිබඳව මේ වන තෙක් දැනුවත් කිරීමක් කර නොමැති බවත්, ඉදිරියේදී මේ සම්බන්ධව පියවර ලබා ගන්නා බවත්, සභාවට අයත් අනෙකුත් සුසාන භූමි හතරම මනාව නඩත්තු වුවද මෙම බුලත්ගම සුසානභූමිය භූමිය පිහිටි ස්ථානය අනුව නඩත්තු කටයුතු විධිමත්ව කරමින් පවත්වා ගෙන යාම සම්බන්ධව ගැටළුවක් පවතින බවත්, මෙම ස්ථානය නඩත්තු කර පවත්වා ගෙන යාමේ හැකියාව ඇති පුද්ගලයෙකු යෝජනා කරන ලෙසට ගරු මන්ත්‍රීතුමන්ලා වෙත යෝජනා කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කලේ මෙය මාස ගණනාවක් තිස්සේ කල් දමමින් පවතින ගැටළුවක් බවට පත්ව ඇති බැවින් කඩිනම් පියවර ලබා ගත යුතු

බවයි.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම ඉතා කඩිනමින් සිදු කළ යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, පසුගිය දිනෙක අවමංගල්‍ය අවස්ථාවකට සහභාගී වීමේදී එහි ඇති අඩුපාඩු කෙරෙහි විශාල ලෙස අවධානයට ලක්වූ බවත්, නගර සභාවට එම සුසානභූමිය නඩත්තු නොකිරීම සම්බන්ධව විශාල දෝෂාරෝපණයක් පවතින බවත්, එබැවින් මේ සම්බන්ධව කඩිනම් අවධානය යොමුකර අවශ්‍ය පියවර ගන්නා ලෙසත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා සඳහන් කලේ රාජය දැව සංස්ථාව මඟින් ඉවත් කළ යුතුව පවතින ගස් ඉවත් කිරීමට ආයතනයට නැවත දැනුවත් කිරීමක් සිදු කළ යුතු බවත් කඩා වැටුණු ස්මාරක ඉවත් කර කඩිනමින් අදාළ නඩත්තු කටයුතු සිදු කළ යුතු බවත්ය.
ගරු සභාපතිතුමා වැඩිදුරටත් සඳහන් කලේ එම පරිශ්‍රය නිරීක්ෂණකට ලක්කර මෙම ගැටළු නිරාකරණය කිරීමට පුද්ගලිකව මැදිහත් වී කටයුතු සිදු කරන බවයි.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති එන්.ඩබ්.පී.ටී.ජයසේන මැතිතුමා**

**07:01:01** නිවාස සංවර්ධන අධිකාරිය සතු 620074 කඩැස්තර සිතියමේ කලාප අංක 03 හි කැබලි අංක 156 දරණ හෙක්ටයාර 0.0972ක් වන නුගමුලහේන නොහොත් නාගහමුල හේන යන කිරිදිගල අනඳමෙත්ගම ප්‍රජා ශාලාව පිහිටි ඉඩම බළන්ගොඩ නගර සභාව වෙත පවරා ගැනීම සඳහා කටයුතු කිරීමට අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පැවසූයේ පසුගිය දිනක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සාකච්ඡාවක් පැවති බවත්,එහිදී එම සමිතියට ඉඩම භාවිතා කිරීමට නොහැකි වේද යන්න පිළිබඳව සැකයක් පවතින බවත්, එම ඉඩම නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති බවත්, ඒ අනුව නිවාස සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර එම ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතු බවත්ය.

අනතුරුව ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ මෙම ප්‍රජාශාලාව දැනට අනඳමෙත්ගම නිවාස ව්‍යාපෘතිය

මගින් ඉදිකළ ගොඩනැගිල්ලක් බවත්, මෙම ස්ථානය කිරිදිගල කොට්ඨාශයේ මැද පිහිටි ස්ථානයක් බවත්, පවුල් සෞඛ්‍ය නිලධාරිනියට රාජකාරි කිරීමට ස්ථානයක් නොමැති බවත්, එමෙන්ම මැතිවරණයක් පැවැත්වීමේදී එම කටයුතු කිරීමට ස්ථානයක් නොමැති බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් එහි ග්‍රාම සංවර්ධන සමිතියේ නිවාස 50ක් පමණ තිබෙන බවත්, එම සමිතියේ ජනතාවගේ බඩු බාහිරාදිය තබා ගැනීමට සහ රැස්වීම් පැවැත්වීම වැනි ඔවුන්ගේ කටයුතු සඳහා කිසිඳු බාධාවක් නොවන පරිදි මෙම ප්‍රජාශාලාව පවරාගෙන නඩත්තු කටයුතු කරමින් විධිමත්ව පවත්වා ගෙන යාමට යෝජනා කරන බවත්ය.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව නිවාස සංවර්ධන අධිකාරිය සතු 620074 කඩැස්තර සිතියමේ කලාප අංක 03 හි කැබලි අංක 156 දරණ හෙක්ටයාර 0.0972ක් වන නුගමුලහේන නොහොත් නාගහමුල හේන යන කිරිදිගල අනදමෙත්ගම ප්‍රජා ශාලාව පිහිටි ඉඩම එහි පවත්නා ග්‍රාම සංවර්ධන සමිතියේ කටයුතු වලට කිසිඳු බාධාවකින් තොරව බළන්ගොඩ නගර සභාව වෙත පවරා ගැනීම සඳහා කටයුතු කිරීමටත් ගරු සභාවේ විරෝධතා නොවූ හෙයින් ඒකමතිකව සම්මත විය.

**07:01:02** බළන්ගොඩ පශු වෛද්‍ය කාර්යාලයේ කිරිහල අලුත්වැඩියා කිරිමේ කර්මාන්තයේ අවසන් බිල්පත වන රු.1,680,158.22 ක මුදල ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා මෙම කර්මාන්තය නගර සභාවේ යටතේ අධීක්ෂණය වූ කර්මාන්තයක්ද යන්නත් සභාවට මෙයින් ලැබෙන ප්‍රතිලාභය කුමක්ද යන්නත් විමසන ලදුව ගරු සභාපතිතුමන් පැවසුයේ නගර සභාවේ අධීක්ෂණය යටතේ පළාත් සභා අරමුදල් මඟින් ක්‍රියාත්මක වූ කර්මාන්තයක් බවයි.අනතුරුව මේ සම්බන්ධව වැඩිදුර කරුණු ලේකම්තුමියගෙන් පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කරගැනීමෙන් පසුව කාරක සභාව මහ සභාව කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:03** මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ ගල් වල අසල නාය යෑමකට ලක් වී ඇති බැවින් එම ස්ථානය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් වාර්තාවක් ලබා ගෙන එම වාර්තාවේ නිර්දේශ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්ව නගර අලංකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට 2025.10.24 දින ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී තීරණය වී ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ මොහාන් සාලිය එල්ලාවල මාවතේ මෙම නායයෑමට ලක්වී ඇති ස්ථානයේ නිවාස කිහිපයක් පවතින බවත්, පසුගියදා පැවති ආපදා තත්වය හේතුවෙන් නිවාස දෙකකට හානි සිදු වූ බවත්, පඹහින්න ප්‍රදේශයේ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මෙවැනි කඳු සහිත ස්ථානයක ඉදිකර ඇති ආරක්ෂිත බැම්ම වැනි ඉදිකිරීමක් මෙම ස්ථානයේද ඉදිකළ යුතු බවට අදහස් කරන බවත්, ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සම්බන්ධීකරණය කර ගනිමින් අදාළ ව්‍යාපෘතිය සිදු කළ යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අදාළ වාර්තාව ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:04** ජාතික ලේඛණාරක්ෂක පනතේ විධි විධානයන්ට අනුව රජයේ කාර්යාල වල අභාවිත ලේඛන අපහරණය කල යුතු අතර ඒ අනුව 2025 සහ 2026 වර්ෂයන්ට අදාල ලේඛන පරීක්ෂා කර බලා එම කටයුත්ත ඉටු කිරීමට සුදුසු දිනයක් හා ඒ සඳහා කමිටුවක් පත්කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ඉහත ලේඛණ අපහරණ කමිටු සාමාජිකයන් ලෙස ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා යන ගරු සභිකවරුන් සුදුසු බවටත් ඒ සඳහා මාර්තු තුන්වැනි අඟහරුවාදා සුදුසු බවටත් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:05** 2026 වර්ෂය තුළදී ප්‍රජාපාදක සංවිධානවලට කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව ත්‍රිපුද්ගල කමිටු නියෝජනය සඳහා නම් කළ නිලධාරින් අනුමත කර ගැනීම.

- බී.එන්.ඩී.එල් .එස්.කේ.බටගොඩ මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බළන්ගොඩ.
- ඒ.එස්.එච්.විජේසිංහ මිය - කාර්මික සහකාර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බළන්ගොඩ.
- එස්.එම්.සී.එස්.කේ. අබේසිරිවර්ධන මයා - වැඩ අධිකාරි, නගර සභාව, බළන්ගොඩ.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:06** 2026.01.29 දින පැවති මුදල් කමිටුවේ තීරණ මහ සභාව වෙත ඉදිරිපත් කිරීම.

1. සභාවේ වාහන අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රවීණතාවයක් ඇති කාර්මිකයෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීමට, පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම.
2. මහජන පොලේ නවාතැන්ගෙන සිටින ජනතාව ඉවත් කිරීමට කටයුතු කිරීම.
3. නව බස් නැවතුම්පල කඩ කාමර වලින් 2025.12.31 දිනට අයවිය යුතු හිඟ ජල ගාස්තු පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ වාහන අළුත්වැඩියා කිරීම යනු විශාල කාර්යයන් රැසක් බවත්, එසේ සියලුම කටයුතු සිදු කරන තනි පුද්ගලයෙකු නොමැති බවත්, ආයතන පවතින බවත්,ඒ අනුව බඳවා ගැනීම කරන්නේ කුමන පාර්ශයවයක්ද යන්නයි.

ගරු සභාපතිතුමන් පැවසුයේ බඳවා ගැනීමේදී එය නිශ්චිතව තීරණය කළ හැකි බවත්,මෙම යෝජනාව යොමු කර ඇත්තේ මුදල් කාරක සභාවේ තීරණය වූ පරිදි පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට බවත්ය.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන්

කලේ මුදල් කාරක සභාවේදී තීරණය වූයේ සාපේක්ෂව කුඩා ප්‍රමාණයේ වැඩ සඳහාද විශාල මුදලක් පිටතට ගෙවීමට සිදුවන බැවින් එවැනි කාරණා සඳහා යොදා ගැනීමට හැකියාව ඇති පුද්ගලයෙකු බඳවා ගැනීම බවයි.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කලේ නගර සභාවේ අනුමත කාර්යය මණ්ඩලයේ ඒලෙස තනතුරක් නොමැති බැවින් එහිදී එම කටයුතු සම්බන්ධව වගකීම ලබා ගන්නේ කව්ද යන්නය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ තනතුරට බඳවා ගැනීමේදී එය සාකච්ඡා කළ හැකි බවත්, දැනට අවශ්‍ය වන්නේ ඊට අදාළ අනුමැතිය පළාත් පාලන කොමසාරිස් මඟින් ලබා ගැනීම බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ වාහන නඩත්තුව සම්බන්ධව සභාවේ විශාල ගැටලු රාශියක් පවතින බවත්, මුදල් කාරක සභාවේදී තීරණය වූයේ වාහන නඩත්තුව සම්බන්ධව වෘත්තීය පුහුණුවක් ඇති NVQ LEVEL දක්වා වෘත්තීය සුදුසුකමක් සහිත පුද්ගලයෙකු බඳවා ගැනීමට බවත්, එසේ බඳවාගැනීමක් සිදු කරන්නේ නම් එය සභාවට වාසියක් වනු ඇති බවත්ය.

ඉහත මහජන පොලේ නවාතැන්ගෙන සිටින ජනතාව ඉවත් කිරීමට කටයුතු කිරීම යන යෝජනාව සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසූයේ එම පිරිස ඉවත් කිරීමට අදාළව මේ වන විටත් පරිවාස නිලධාරී දැනුවත් කර ඇති බවත්, ඉදිරියේදී අවශ්‍ය පියවර ගනු ලබන බවත්ය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ දරුවන් පරිවාස භාරයට ගත්තද එහි අනවසරයෙන් සිටින අනෙකුත් පිරිස ඉවත් කිරීමට අධිකරණ නියෝගයක් ගෙන ඒ අනුව කටයුතු සිදු කර රැඳවුම් මධ්‍යස්ථානයක් වෙත භාර දිය යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඒම්.ටී.එම් රූමි මැතිතුමා සඳහන් කලේ මෙම පොළ භූමියේ අනවසරයෙන් පදිංචි වී සිටින පිරිස ඉවත් කිරීමට මීට ඉහත අවස්ථා ගණනාවකදී උත්සාහ කළද එය ඉටු නොවූ බවයි.

ඉහත නව බස් නැවතුම්පල කඩ කාමර වලින් 2025.12.31 දිනට අයවිය යුතු හිඟ ජල ගාස්තු පිළිබඳ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.ඒ අනුව එතුමා පැවසූයේ මෙම හිඟ ගාස්තු සියල්ලම මේ වන විට අයකරගැනීමට කටයුතු සිදු කර ඇති බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ මුගුණමලය මාර්ගය නඩත්තු කිරීමට අදාළව ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස වැඩ අධිකාරී මහතා වෙත දැනුම් දුන්නද එය සිදු වී නොමැති බවත්, එය සිදු නොවන්නේ තමන් නිසාද යන්න නොදන්නා බවත්, නමුත් ප්‍රදේශයේ ජනතාව දෝෂාරෝපණය සිදු කරන්නේ මාලිමා රජයට බවත්,

මුගුණමලය වික්‍රමසිංහ මහතා වීථි පහනක ආම් ඒක දාලා දෙන්න යන්න පැවසූ නමුත් එතුමා ජීවතුන් අතර සිටියදි එම අවශ්‍යතාවය සභාවෙන් ඉටු නොකිරීම සම්බන්ධව සංවේදී වන බවත්ය.

ගරු සභාපතිතුමන් පැවසුයේ වීථි පහන් සවි කිරීමේ කටයුතු සිදු වන බවත්, ඉදිරියේදී ඒ පිළිබඳව සොයා බලා කටයුතු සිදු කරන බවත්ය.

**07:01:07** බළන්ගොඩ නගර සභාවට අයත් කඩ කාමරවල බදු අයිතිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පලාත් පාලන කොමසාරිස්තුමාගේ CLG/LG/-5/3/1 – (IV වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය අනුව අතුරු බදු ලබා දී ඇති කඩ කාමරවල බදු අයිතිය අතුරු බදුකරුගේ නමින් සංශෝධනය කර ගැනීම සඳහා බදුකරුවන් විසින් ඉල්ලීම් කර ඇති අතර ඉදිරි කටයුතු සිදු කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

| අනු අංකය | කඩ කාමර අංකය | ගිවිසුම්ගත බදුකරුගේ නම | අතුරු බදුකරුගේ නම |
|---|---|---|---|
| 01. | පොදු වෙළෙඳසැල අංක 01 | හබකල කංකානමගේ නන්දනී අල්විස් | සුහසිංහ ආරච්චිගේ සුජීවා |
| 02. | පොදු වෙළෙඳසැල අංක 02 | හබකල කංකානමගේ නන්දනී අල්විස් | සුහසිංහ ආරච්චිගේ සුජීවා |
| 03. | පදික කඩ අංක 185/11 | පෝද්දිවෙල හේවගේ චින්තක සුසන්ත කුමාර | සිවසූරියම් අන්වීක්ෂා ධනංජනී |
| 04. | පදික කඩ අංක 185/22 | මොහිදීන් ලෙබ්බේ හාරිදු මොහමඩ් ෂිහාන් | කිරිකට්ටඩියලාගේ හංස ලක්මාල් |
| 05. | කාර් පාක් අංක 04 | මස්සැන්න අම්පිටියාවත්තතේ කල්යාණි විජේතුංග | අලංකාරගේ චමින්ද හේමකුමාර |
| 06. | මැණික් කඩ අංක 08 | වඩුගේ වත්තේ ලූසියා | ජී. අජිත් නයනප්‍රිය ඇල්බට් |
| 07. | නව පදික කඩ 197/01/A | සුබ්‍රමනියම් චන්ද්‍රිකා | සදාසිවන් නිශාන්ති |
| 08. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක ඒ-20 | මහම්මදු ඉස්මායිල් හමීම් මහම්මදු | වරුණ තිලංක දිසානායක |
| 09. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-04 | අබ්දුල් රසාක් මොහොමඩ් අසීම් | අසේල චින්තක සුභාෂ් කහංගම |
| 10. | පොළ කඩ අංක 01/A | ඉන්දිකා සංජීවනී වරකාවත්ත | කිරිය කට්ටඩියලාගේ තීක්ෂණ ජීවත්ත ලක්මාල් |
| 11. | පොළ කඩ අංක 06 | ඉන්දික එරික් සිසිල් | තෙල්ගේ දිනේෂ් කුමාර පීරිස් |
| 12. | පොළ ගබඩා අංක 185/A/2 | දෙනගම විතාරණගේ රංජිත් | මිත්‍රිගේ සුරංග මැණික් විජේතුංග |
| 13. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-06 | දෙමටහෙට්ටිගේ සරත් ප්‍රේමචන්ද්‍ර කුමාරසිරි | උසන්තප්‍රිය ගුණසේකර |

| | | | |
|---|---|---|---|
| 14. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-08 | මොහමඩ් රාසික් ෆාතිමා රිස්මියා | චන්ද්‍රමෝහන් දයාබරන් |
| 15. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-18 | නූහු මරික්කාර් මොහමඩ් සිද්දික් | මොහමඩ් මර්සූක් මොහමඩ් ජවාස් |
| 16. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-19 | ක්‍රිෂ්ණන් රවීන්ද්‍ර | වියලිගොඩ විතාන ආරච්චිලාගේ නිමන්ත නිරෝෂන් ජයසේකර |
| 17 | බස් නැවතුම්පොළ කඩ කාමර අංක සී-10 | කඳන කංකානම්ලාගේ චන්ද්‍රදාස | පොන්නම්පෙරුමගේ බර්නි නදීෂා ප්‍රනාන්දු |
| 18 | මහජන පොළ කඩ අංක 11 | සෙම්බු කුට්ටිගේ එමිකා රෝෂණි ද සිල්වා | තෙලේනිස් ආරච්චිගේ දීපාල් තෙලේනිස් |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:08** බරපතල සෞඛ්‍ය ගැටළු හා බෝ නොවන රෝග ඇතිවීමේ අවධානම ඉතා ඉහල කිරීමට ඉවහල් වන ලන්ච් ෂීට්, නගර සීමාව තුල පවතින ආයතන හා වැඩබිම් වැනි ස්ථාන වල භාවිතා කිරීම නතර කිරීම සඳහා ලිඛිතව හා වාචිකව එම ආයතන දැනුම්වත් කර ලන්ච් ෂීට් භාවිතය නතර කරවීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් පැවසූයේ කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේද මෙම ඉවත දමන ලන්ච් ෂීට් වෙනුවෙන් විකල්පයක් නොමැති බවත්, සිදු කළ යුත්තේ භාවිතය හැකිතාක් අවම කිරීමට කටයුතු කළ යුතුවීම බවත්, ඒ සම්බන්ධව දැනුවත් කිරීම් සිදු කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමන් මහත් වෙහෙසක් ගන්නා බවත්ය.

අනතුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ සෞඛ්‍යමය කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා විසින් ඒකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:09** බළන්ගොඩ නගර සභා මහජන පොළ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයට අදාළ පළමු බිල්පත වන රු.1,211,975.47 ක මුදල ගෙවීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මෙම කර්මාන්තයේ මුළු ඇස්තමේන්තු මුදල පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් විමසන ලදුව ඒ සම්බන්ධව කරුණු කාර්මික නිලධාරී මහතාගෙන් විමසීම කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ඉහත කර්මාන්තය පිළිබඳ කරුණු කාර්මික නිලධාරී මහතාගෙන් විමසීම් කිරීමෙන් අනතුරුව කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:10** 2026.02.16 දිනැතිව කොම්පෝස්ට් පොහොර කිලෝග්‍රෑම් 5000ක් ඉල්ලුම් කළ නමුත් පොහොර කිලෝග්‍රෑම් 2500ක් පමණක් අවශ්‍ය බව අනාවරණය වූ බැවින් එම ප්‍රමාණයට අදාළව ගෙවීම් කර ඇති රු.12,500 ක මුදල නැවත ලබා දෙන ලෙස පනාගේ ප්‍රියමූර්ති හිමි ඉල්ලීමක් යොමු කර ඇත.ඒ අනුව එකී මුදල නිදහස් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:11** බළන්ගොඩ නගර සභාවේ රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය ලබාගත් එල්.ඒ නිමල් සෝමරත්න මහතා විසින් රජයේ නිවාඩු දිනවල (පොහෝ දින, නිදහස් දින) නගරයට පැමිණෙන වාහන අඩුවන හෙයින් එවැනි දිනවලදී ආදායම ප්‍රමාණවත් පරිදි නොලැබෙන බැවින් රජයේ නිවාඩු දින සඳහා සභාවට ගෙවිය යුතු ගාස්තු අඩුකරදෙන ලෙස ඉල්ලීම් කර ඇත.රථ වාහන ගාස්තු අයකිරීමේ ගිවිසුමේ අංක 13 වගන්තිය අනුව ගාස්තු අඩු කිරීමක් නොකරන බව දක්වා ඇත.ඒ අනුව මෙම ඉල්ලීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගිවිසුම් අනුව මෙම ඉල්ලීම සඳහා අවස්ථාව ලබා දිය නොහැකි බවත් ගාස්තු අඩු කිරීමක් කළ නොහැකි බවත්, ගරු සභාපතිතුමන් විසින් පැවසීය.ඒ අනුව මෙම ඉල්ලීම ගරු සභාවේ ප්‍රතික්ෂේප විය.

**07:01:12** බලංගොඩ නගර සභාව සතු නව බස්නැවතුම්පොල කඩ කාමර සඳහා 2026 ජනවාරි සිට ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් කර ඇති නව තක්සේරුව නැවත සලකා බැලීම සඳහා ඉල්ලීමක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසුයේ බලංගොඩ නගර සභාව සතු නව බස්නැවතුම්පොල කඩ කාමර සඳහා කඩ හිමියන්ගේ ඉල්ලීම් පරිදි මෙම ඉල්ලීම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කරන බවයි.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ මෙම ඉල්ලීම බස් නැවතුම්පොළ කඩ කාමර සඳහා පමණක්ද යන්නයි.එහිදී ගරු සභාපතිතුමා පැවසුයේ පොදුවේ නව තක්සේරුව පිළිබඳව සලකා බලන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමක් කළ හැකි බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:13** අක්කර 18 පිවිසුම් මාර්ගයේ වේ ගඟ හරහා ඇති බෝක්කුව ඉදිකිරීම සඳහා සහ ඒ සඳහා වන රු. 3,500,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා මේ පිළිබඳව කරුණු පැහැදිලි කරමින් පැවසුයේ මෙම කර්මාන්තයේ ප්‍රසම්පාදන කටයුතු වලට අදාළව විරෝධතා/අභියාචනා කාලය අවසන් වී ඇති බවත්, ඒ අනුව අභියාචනා ලැබී නොමැති බැවින් OK කන්ස්ට්‍රක්ෂන් වෙත පිරිනැමීමට ප්‍රසම්පාදන තීරණය වූ බවත් එම ආයතනය වෙත කර්මාන්තය පිරිනැමීම වෙනුවෙන් සභාවේ විරුද්ධත්වයක් නොමැති හෙයින් එම ආයතනය වෙත කර්මාන්තය පිරිනැමීම සිදු කරන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:14** සභාපති අරමුදලින් ගෙවීම් කිරීම වෙනුවෙන් චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය ලබා දිය යුතු සභිකවරුන් දෙදෙනෙකු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාපති අරමුදලින් ගෙවීම් කිරීම වෙනුවෙන් චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය ලබා දීම වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා පැවසූයේ තමන් ඒ වෙනුවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා යෝජනා කරන බවයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

සභාපති අරමුදලින් ගෙවීම් කිරීම වෙනුවෙන් චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය ලබා දීම වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**විශේෂ යෝජනා**

**07:01:15** 2026 සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සව සමයේ ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් මහජනයා දැනුවත් කිරීමට අවසර ලබා දෙන ලෙසට මාධ්‍යවේදී නාලක ජේ.හෙට්ටිආරච්චි යොමු කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:16** 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගණකාධිකාරිතුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

මූල්‍ය ප්‍රකාශය පිළිබඳව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:17** පොහොර කැබලි කරන යන්ත්‍රයක් සහ පොහොර හලන යන්ත්‍රයක් සභාවට එකඟතා ගිවිසුමක් මත නොමිලේ ලබා දිම වෙනුවෙන් පහත සේවාවන් ලබා දෙන ලෙස සමනලවැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය යොමුකර ඇති ඉල්ලීම් පිළිබඳව තීරණය කිරීම.

- සමකට කොම්පෝස්ට් පොහොර පැකට් 10බැගින් නොමිලේ ලබා දීම.
- භූමිය සකස් කර ගැනිමට දින කීපපයකට බැකෝ යන්ත්‍රය ලබා දීම.
- වසරකට අවස්ථා දෙකකදී ගලි බවුසරයේ සේවය ලබා දීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02** ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී. නදීක සේනාරත්න මැතිතුමා

**07:02:01** ආයුර්වේද ස්ථානය තුල ආයුර්වේද අලෙවි සැලක් හා ආයුර්වේද රූපලාවන්‍යාගාරයක් සඳහා අදාල ව්‍යාපෘති යෝජනාවක් සැදීමට ආයුර්වේද වෛද්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් යුතුව කමිටුවක් පත්කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ ඉහත ව්‍යාපෘති යෝජනාව සකස් කර ඇති බවත් කමිටුවක් පත්කර ඉදිරියට කරගෙන යා හැකි ආකාරයට සකස් කළ යුතු බවත්ය.අනතුරුව ගරු සභාපතිතුමන් පැවසුයේ එම කමිටුව සඳහා සාමාජිකයන් යෝජනා කරන ලෙසයි.

ඒ අනුව ඉහත කමිටුවේ සාමාජිකත්වය සඳහා, ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යන ගරු සභිකවරුන් පත් කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා

යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමන් එම කමිටුව වෙත ආයුර්වේද වෛද්‍ය නිලධාරී සුදුසු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ඉහත කමිටුව සඳහා දිස්ත්‍රික් ආහාර හා ඖෂධ පාලකතුමා සුදුසු බවට යෝජනා කරන ලදී.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් එකී යෝජනා ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:02** 2025-12-31 දිනට සභාව සතු අවසන් තොග ශේෂ ලබාදීමට පෙර සභාවේදී කාලය ඉල්ලා සිටි බැවින් කාලය ගෙවී ඇති බැවින් අවසන් තොග ශේෂ සභාවට ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.එහි ආරම්භක තොග ශේෂය දක්වන්න.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමන් විසින් අවසන් තොග ශේෂ සභාවට ඉදිරිපත් කරන ලදී.

**07:02:03** ප්‍රාමාණික දැනුම ඇති පුද්ගලයෙක් ලබාගෙන යන්ත්‍ර හා නඩත්තු අළුත්වැඩියා අංගනයක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:04** 2025 වර්ෂයේ සෞඛ්‍ය අංශය විසින් නඩු පවරන ආයතන සහ පුද්ගලයන් සම්බන්ධ සංක්ෂිප්ත වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව 2025 වර්ෂයේ සෞඛ්‍ය අංශය විසින් නඩු පවරන ආයතන සහ පුද්ගලයන් සම්බන්ධව පහත විස්තරය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| **මාසය** | **නඩු අංකය** | **නඩුව සම්බන්ධ විස්තර** |
|---|---|---|

| | | |
|---|---|---|
| 2025 අගෝස්තු | 6280/213 | වර්ණ කරන ලද සහල් විකිණීම<br>රු.9000 දඩ සහ ලක්ෂයක ශරීර ඇප |
| 2025 ඔක්තොම්බර් | 5588 | කෘමි සතුන් සහිත අබ නමැති ආහාර විකිණීම දඩය රු.3000 |

**07:03 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා**

**07:03:01** බළන්ගොඩ නගර සභාවේ 2025 මූල්‍ය හා කාර්යසාධන විගණන විමසුම සභාවට ඉදිරිපත් කර සාකච්ඡාවට ගැනීම සඳහා යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.මෙහිදී ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුයේ 2025 මූල්‍ය හා කාර්යසාධන විගණන විමසුම පිළිබඳව ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා වෙත දළ අවබෝධයක් ලබා ගත යුතු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, ආයතනය දැනට පවතින්නේ කුමන තත්වයකද යන්න සම්බන්ධව මේ හරහා අවබෝධයක් ලබා ගැනීමට ඇති හැකියාව හේතුවෙන් බවත්ය.

**07:03:02** නගර අලංකරණ ක්‍රියාවලිය බාහිර පාර්ශවයකට ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා සඳහන් කලේ සභාව මේ වන විට පවතින මූල්‍යමය හැකියාව මත සභාවට මේ සඳහා විශාල මුදලක් වැය දැරීමට සිදුවන බවත්, එමෙන්ම ඒ සඳහා යොමුකරන අවධානයේ යම් අඩුවක්ද පවතින බවත්, එබැවින් නගර අලංකරණ කාර්යය සඳහා බාහිර පාර්ශවයක් වෙත ප්‍රචාරක කටයුතු සමඟ ලබා දිය හැකි බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ මේ සම්බන්ධව පුද්ගලික ආයතන දෙකකින් ඉල්ලීම් ලැබුණ බවත්, ඒ සඳහා ප්‍රතිචාරයක් තවම ලැබී නොමැති බවත්, ඒ අනුව ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා සඳහන් කලේ මේ සම්බන්ධව පසුගිය සමයේදීද බළන්ගොඩ ඔරලෝසු කණුව අසළ කොටස අලංකරණය කිරීම වෙනුවෙන් පුද්ගලික ආයතනයක් සම්බන්ධ කරගත් බවත්, එහිදී මුදල් ගෙවීම් පවා සිදු කළද ක්‍රියාත්මක

නොවුන බවත්, එසේ පුද්ගලික අංශයට භාරදෙන්නේ නම් වැඩ අධිකාරී/කාර්මික නිලධාරී අධීක්ෂණය යටතේ නිසි ක්‍රමවේදයක් මත සිදු විය යුතු බවත්, එසේ නොමැති වුවහොත් නගරය අවලස්සන වන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:03** ආයතනයේ ගබඩා අංශය සහ කර්මාන්ත අංශයේ නිලධාරි මහතුන් සඳහා කඩිනම් පරිගණක යෙදවුම් පුහුණු වැඩ සටහන පරිගණක නිලධාරි සංකල්ප මහතා මඟින් සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසූයේ සබරගමුව පළාතේම පිහිටි පළාත් පාලන ආයතන අතරින් තවමත් මෙම සභාවද ඇතුළුව ආයතන 08 පමණක් රජයෙන් නොමිලේ ලබාදෙන නව පරිගණක යෙදවුම් පද්ධතියට අනුගත වී නොමැති බවත්, එයට අනිවාර්යෙන් අනුගත විය යුතු බවත්, දැනට ආයතනයේ පවතින්නේ මුදල් ගෙවා එක් එක් කාර්යයන්ට අදාළව පවතින පරිගණක පද්ධති බවත්,මේ සම්බන්ධව සංකල්ප මහතා දැනුවත් කළ යුතු බවත්,ඒ අනුව අනිවාර්යෙන් එයට අනුගත විය යුතු බවත්ය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන් කලේ ඩිජිටල්කරණය යන කාරණාවත් සමඟ සාකච්ඡා කිරීමේදි අවම වශයෙන් සභාවේ media unit එකක්වත් ආරම්භ කිරීමට පියවර ගත යුතු බවත්, සභාවෙන් සිදුවන වැඩ ජනතාව කරා යාමේ වෙනත් මාර්ගයක් නොමැති බවත්ය.ඒ අනුව එතුමා සභාවේ media unit එක ආරම්භ කිරීමට යෝජනා කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා සඳහන් කලේ මෙම කාර්යය මීට පෙර ආරම්භ කිරීමට කටයුතු සකස් කළද එය ක්‍රියාත්මක තත්වයේ නොමැති බවත්, මේ වන විට පළාත් පාලන ආයතන අනුගමනය කරන ගිණුම්කරණ පැකේජ වන SIGAS වැනි නව යෙදවුම් කරා ආයතනයක් ලෙස ගමන් කළ යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:04** නගරය තුල ඉතාම අවලස්සන ආකාරයට සිදුවන පෝස්ටර් ඇලවීම පාලනය කිරීම සඳහා පෝස්ටර් ඇලවීම සඳහාම පමණක් වෙන් වූ පුවරු හඳුනාගත් ස්ථාන වල ඉදි කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:05** බළන්ගොඩ සිටින සියලුම උපකාරක ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා කඩිනම් දිනයක් යෝජනා කර ගැනීම සඳහා කටයුතු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා සඳහන් කලේ බළන්ගොඩ නගරයේ අසීමාන්තික පෝස්ටර් ඇලවීමක් සිදුවන බවත්, තැනක් නොතැනක් නොමැතිව සෑම තැනකම පාහේ කටවුට් දමා ඇති බවත්, උපකාරක පන්ති පවත්වන ආයතනවල සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සැලකීමේදී ඉතාම පහත් තත්වයේ පවතින බවත්, ඒ පිළිබඳව අනිවාර්යෙන් දැනුවත් කිරීමක් සිදු කළ යුතු බවත්, නගරයේ සෑම තැනකම පාහේ ඉටිකොළ දමා පොස්ටර් ඇලවීම සිදු කර ඇති බවත්, නමුත් එසේ කිරීම අතුරු ව්‍යවස්ථාව අනුව තහනම් බවත්, මූලික අදියර ලෙස එම උපකාරක පන්ති පවත්වන ගුරුවරුන් සහ ආයතනවල හිමිකරුවන් ගෙන්වා දැනුවත් කිරීමක් සිදු කර ක්‍රමවත් වැඩපිළිවෙලකට යා යුතු බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ නගරය තුල ඉතාම අවලස්සන ආකාරයට සිදුවන පෝස්ටර් ඇලවීම පාලනය කිරීම සඳහා පෝස්ටර් ඇලවීම සඳහාම පමණක් වෙන් වූ පුවරු හඳුනාගත් ස්ථාන වල ඉදි කිරීමට යෝජනා කළ බවත්, කොළඹ ගම්පහ වැනි නගරවල එසේ වෙනම ස්ථාන පවතින බවත්, එවැනි ක්‍රමවේදයකට යා යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා පැවසුයේ චමික සභාපතිතුමාගේ කාලයේදීද මෙලෙස උපකාරක ගුරුවරුන් ගෙන්වා දැනුවත් කිරීමක් සිදු කළ බවත්, නමුත් එම දැනුවත් කිරීම් පරිදි ක්‍රියාකිරීම අඛණ්ඩව ගලායාමක් සිදු නොවන බවත් කාලයක් ගොස් ආපසු බැනර්, පොස්ටර් ,කටවුට් නගරයේ ඒ ආකාරයටම පවතින බවත්, ඉහත යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත්, එය අනිවාර්යෙන් ක්‍රියාත්මක කළ යුතු බවත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, පසුගිය දිනෙක සිප්යානා ආයතනයේ ගලි වලවල් පවතින ස්ථානයක් නිරීක්ෂණය කළ බවත්, ස්වභාවිකව ජලය ගලා යන මාර්ගය අවහිර කර ඇති බවත්, ඒ පිළිබඳ කඩිනම් අවධානය යොමුකර නැවත පරීක්ෂා කිරීමක් සිදු කරන ලෙසයි.

මුල්‍ය ආයතන වලිනුත් නගරයේ තැන් නැන්වල පොස්ටර් ඇලවීම සිදු කරන බවත්, එය පාලනය කිරීමට අදාළව ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කරන ලදී.ගරු සභාපතිතුමා පැවසුයේ එම ආකාරයට පවතින පොස්ටර් පාලනය කිරීම වෙනුවෙන් ආදායම් අංශය මඟින් දෛනිකව ක්‍රියාමාර්ග ගන්නා බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:06** සභාවේ සියළුම සේවකයන් සඳහා සෞඛ්‍ය කඳවුරක් පැවැත්වීමටත් ඒ සඳහා දිනයක් තීරණය කිරීමටත් යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ සියළුම සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ගෙන් කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාළ සාකච්ඡාවෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04** ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා

**07:04:01** කුමාරගම වසමේ ආර්ථික සංවර්ධන කාර්යාලය අසල සිට සෝමරත්න මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ ඛාදනය වී ඇති ස්ථානය සඳහා පැති බැම්මක් යොදා පිළිසකර කිරීමටත්, ඊට අදාළ ඇස්තමේන්තුව වන රු.375,000 සඳහාත් අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ මෙම ස්ථානයේ පසුගිය ආපදා තත්වයේදී එම ස්ථානයේ පැති බැම්ම කඩා

ගෙන ගොස් ඇති බවත්, ඊට අදාළ අමුද්‍රව්‍ය ලබා දීමට කටයුතු කරන්නේ නම් ඉතිරි වැඩ කොටස එම ජනතාව කර ගන්නා බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:02** පොළ භූමිය අසල සිට ළමා උද්‍යානය දක්වා ඇති මාර්ගය ඉතාම අබලන් තත්වයේ පවතින බැවින් තාර හෝ ප්‍රිමික්ස් යොදා යථා තත්වයට පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ මෙම මාර්ගය කාලයක් තිස්සේ අබලන් වී ඇති බවත්, ඉදිරියට පැමිණෙන්නේ උත්සව සමය බවත් එහිදී විශාල වාහන ප්‍රමාණයක් නැවැත්විමට සිදුවන බවත්, එමෙන්ම පිටස්තර වෙළෙන්දන් රැසක් පැමිණෙන බවත්, මෙතෙක් ජනතාවට මෙම මාර්ගය නඩත්තු කිරීම පසුවට කල් දැමීමට හේතුව වශයෙන් ඉදිරිපත් කලේ මේ සඳහා කාපට් ව්‍යාපෘතියක් ඉදිරියේදී පැමිණෙන බව ප්‍රකාශ කිරීම බවත්, නමුත් එය මෑතකදී සිදුවන බවක් පෙනෙන්නට නොමැති බැවින් මෙම මාර්ග කොටස සභාවේ මූල්‍යමය හැකියාව මත ප්‍රිමික්ස් හෝ තාර යොදා කඩිනමින් අළුත්වැඩියා කළ යුතු බවත්ය.

මේ සම්බන්ධව කරුණු වැඩ අධිකාරී මහතාගෙන් විමසීම් කිරීම වෙනුවෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

අනතුරුව කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05** **ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

**07:05:01** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන රු.75,000 මුදලින් බළන්ගොඩ ගොරොක්ගහමඩ එෆ්.එච්. මාවත සිට ප්‍රධාන ඉස්ලාම් දේවස්ථානයට පිවිසෙන අතුරු මාර්ගය සංවර්ධනය කර නිම කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05:02** බළන්ගොඩ ගොරොක්ගහමඩ එෆ්.එච්. මාවතට පිවිසෙන මාර්ගය (නගර සභා සීමාව) තද බෑවුම් සහිත මාර්ගයක් වන අතර එම මාර්ගයේ මේ වන විට සෑදී ඇති විශාල වලවල් වසා මාර්ගය කඩිනමින් අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06 ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය**

**07:06:01** මුගුණමලය මාර්ගය නඩත්තු නොකිරීම සම්බන්ධව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වමින් පැවසුයේ මුගුණමලය මාර්ගය නගරයට පැමිණිය හැකි විකල්ප මාර්ගයක් ලෙස භාවිතා වන බවත්, මුදල් නොමැති බව පවසමින් කාලයක් තිස්සේ මෙම මාර්ගය නඩත්තු නොකරන බවත්, ඒ සම්බන්ධව කරුණු දැනගැනීමට අවශ්‍ය වන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ තාවකාලික නඩත්තුවක් පසුගිය දිනෙක සිදුකළ බවත්, ඉදිරි සංවර්ධන කටයුතුවලදී මේ සඳහා ඇස්තමේන්තුවක් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් පවසා සිටියේ මෙම මාර්ගය අධික බෑවුම් සහිත මාර්ගයක් බවත්, මුදල් කාරක සභාවේදීද මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත්, ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරන බව පැවසූ බවත්, මෙහි ක්‍රොන්ක්‍රීට් දමා වලවල් වසා ගමනාගමනයට සුදුසු පරිදි සකස් කර දෙන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන් කලේ අනඳමෙත්ගම ජල සම්පාදන මාර්ගයද නඩත්තු කරන ලෙස ඉල්ලීම් කරන බවත්, එමෙන්ම ඉහත මුගුණමලය

මාර්ගය නඩත්තු කිරීමේ කටයුතු සඳහා විශාල මුදලක් දැරීමට සිදු වන්නේ නම් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා වෙත ඉල්ලීම් යොමු කර හෝ ඒ සම්බන්ධව කටයුතු කිරීමට ඉල්ලීම් කරන බවයි.

ගරු සභාපතිතුමන් පැවසුයේ මේ සම්බන්ධව පෞද්ගලිකව මැදිහත්වී කටයුතු සිදු කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:02** කේ.ඒ.චමින්ද ලක්රුවන් බණ්ඩාර මයාගේ සේවය ස්ථිර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසුයේ මේ සම්බන්ධව කේ.ඒ.චමින්ද ලක්රුවන් බණ්ඩාර මයාගේ සේවය ස්ථිර කිරීමට ඉල්ලීමක් 2025.07.17 දිනැතිව ලිපියක් යොමුකර ඇති බවත්, නමුත් රියදුරු සේවයේ ස්ථිර කිරීමට ඔහුගේ අධ්‍යාපන සුදුසුකම්වල යම් අඩුවක් තිබූ බැවින් එයට අනුමැතිය නොලැබුන බවත්, නමුත් මේ වන විට ඔහු NVQ LEVEL IV දක්වා සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත් ඒ අනුව ඉදිරියේදි එම මහතාගේ සේවය ස්ථිර කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත්ය.

මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කළ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ තමන් සභාපති ධූරය දරන කාලයේ ඉහත කේ.ඒ.චමින්ද ලක්රුවන් බණ්ඩාර මයාගේ සේවය ස්ථිර කිරීමට ඉල්ලීමක් යොමුකළ බවයි.අනතුරුව එතුමා පළාත් පාලන කොමසාරිස් වෙත යැවූ ලිපිය සහ ආපසු ලද ලිපිය සභාගත කරන ලදී.තවදුරටත් කරුණු දක්වමින් එතුමා පැවසුයේ සබරගමුව පළාතේ පමණක් නොව සෑම පළාත් පාලන ආයතනකම මෙම ගැටළුව පවත්නා බවත්, ඒ අනුව එම ලිපි පළාත් සභාව විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන බවත්, පසුවද මේ සම්බන්ධව විමසීම් කිරීම අදාළ ආයතන තුළින් සිදු කළ බවත්, එහිදී ඊට අදාළව ඉදිරියේදී තීරණ ලබා ගන්නා බව දැනුම් දුන් බවත් ඒ අනුව ඉදිරියේදී එම තීරණ දැනුම් දෙනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ පසුගිය සභා වාරයක තමන් මේ සම්බන්ධව දැනුවත් කිරීමක් කළ බවත්, එවිට පැවසුයේ එසේ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ නොවන සේවකයන් සඳහා NVQ LEVEL IV මට්ටම දක්වා පැමිණි විට එය අ.පො.ස සා.පෙළ සමත් ලෙස සලකනු ලබන බව පැවසූ බවත්, නමුත් මේ වන තෙක් එසේ අධ්‍යාපන සුදුසුකම් සපුරනු නොලබූ සේවකයන් වෘත්තීය අධ්‍යාපනයකට යොමු කිරීමට

අවශ්‍ය පියවර ආයතනය මඟින් නොගෙන ඇති බවත්, මෙම සේවකයන් ඉතාමත් හොඳින් රාජකාරිය සිදුකරන බවත්, මෙම ආයතනය මඟින් නම් හතරක් පමණක් ස්ථිර කර දෙන ලෙස ලිපි යොමු කර ඇති බවත්, එසේ වෙනත් තනතුරක සේවය ස්ථිර කිරීමට අදාළ අධ්‍යාපන සුදුසුකම් සපුරාලිය යුතු බැවින් ඒවා සම්පූර්ණ නොකර එසේ යැවීමෙන් ඵලක් නොවන බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ මෙහි පවතින පුරප්පාඩු වලට අදාළව ඒවා බාහිරින් සම්පූර්ණ වූ පසු සභාවේ සිටින සේවකයන්ට එම තනතුරුවල ස්ථිර වීමට නොහැකි බවත්, එම සේවකයන්ගේ සේවය ස්ථිර කිරීමට අදාළව ඔවුනට වෘත්තීය අධ්‍යාපනය ලබාදීමට අදාළ යොමුකිරීම් සිදුකර ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට කඩිනම් අවධානය යොමුකරන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ කේ.ඒ.චමින්ද ලක්රුවන් බණ්ඩාර මයාගේ සේවය ස්ථිර කිරීමට අදාළව ඔහු විසින් මේ වන විට අදාළ වෘත්තීය අධ්‍යාපන මට්ටම ළඟා කර ගෙන ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ඇති බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:03** අනඳමෙත්ගම ජල සම්පාදන මණ්ඩලය මාර්ගයේ සංසදාස මහතාගේ නිවස අසල බෝක්කුව ඉදි කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කලේ ජල සම්පාදන මණ්ඩලය මාර්ගයේ පළමුවෙනි හරස් මාර්ගයේ පවතින බටය මඟින් ජලය ගලා යාමට ප්‍රමාණවත් නොවන බැවින් එයට බෝක්කුවක් යොදා සකස් කර දෙන ලෙස යෝජනා කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා සඳහන් කලේ එතුමාගෙනුත් එම ප්‍රදේශවාසීන් පෞද්ගලිකව මෙම ඉල්ලීම සිදු කළ බවයි.ගරු සභාපතිතුමා පැවසුයේ ජල සම්පාදන මාර්ගය අළුත්වැඩියා කරදෙන ලෙස තමන්ගෙන්ද පෞද්ගලිකව ඉල්ලීම් කළ බවත්, ඒ අනුව මෙම කාර්යයන් දෙකම එකවර ඉදිරියේදී සිදු කරන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**07:07:01** නගරයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ පසුගිය දිනෙක නගරයේ ඔරලෝසු කණුව අසළ අනවසර ඉදිකිරීමක් සම්බන්ධව සමාජ මාධ්‍යය තුළ ආන්දෝලනාත්මක ලෙස ප්‍රචාරය වූ බවත්, එම අවස්ථාවේදි එම ඉදිකිරීම නීත්‍යානුකූල බව පැවසුවද දැනට එම ඉදිකිරීම තහනම් කර ඇති බවත්, එසේ සිදුවන්නේ ඇයිද යන්නත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ එම ඉදිකිරීම කළ පුද්ගලයා සභාවත් නොමඟ යවා ඇති බවත්, ඒ අනුව අදාළ ලියකියවිලි පරීක්ෂා කර බලා ඉදිකිරීම අත්හිටවූ බවත්, එම පුද්ගලයා මේ වන විට දිවුරුම් ප්‍රකාශයක් මඟින් නැවත ඉදිකිරීමක් නොකරන බවට අත්සන් කර ලබා දී ඇති බවත්ය.

**07:07:02** සෞඛ්‍ය අංශය සම්බන්ධව සාකච්ඡා කිරීමට සහ නලින් තුසිත අළුත්ගේ රියදුරු මහතා පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන් නගරය පිරිසිදුව පවත්වා ගෙන යාමට මහත් වෙහෙසක් ගන්නා බවත්, දෙහිගස්තලාව මාර්ගයේ කසළ ට්‍රැක්ටර් රථයේ රියදුරු වන ඉහත නලීන් මහතා එම කාර්යය මනාව කළමණාකරණය කරමින් සිදු කරන බවත්, ඔහුට ඇගයීමක් වශයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, අනිත් ට්‍රැක්ටර් රථ රියදුරන්ටත් ඔහු ආදර්ශයක් වන ලෙසට එම කාර්යය ඔහු සිදු කරන බවත්, ඔහුට ප්‍රශංසා සහතිකයක් ලබා දීමට යෝජනා කරන බවත්ය.

ගරු සභාපතිතුමන් පැවසූයේ එම රියදුරු මහතා ආයතනය වෙනුවෙන් මහත් කැපවීමක් කරමින් රාජකාරි කරන හදිසි අවස්ථාවක වුවද ගෙන්වා ගැනීමට හැකියාව ඇති රියදුරු මහතෙකු බවත්, සෞඛ්‍ය අංශය වෙනුවෙන් එතුමාගේ සේවය අගය කරන බවත් එම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා වෙත ස්තුතිවන්ත වන බවත්ය.

**07:07:03** වාහන නඩත්තු කටයුතු සම්බන්ධව අදහස් දැක්වීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාවෙන් දක්වා ඇති කරුණ සම්බන්ධව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඡායාරූපයක් පෙන්නමින් සඳහන් කලේ නගර සභාවේ ට්‍රැක්ටර් රථයක් අළුත්වැඩියාවට දමා වල්වැදී ඇති ආකාරය එයින් පෙන්නුම් කරන බවත්, මෙහි ඩිපෝ වාර්තාවේ සඳහන් වන්නේ සයිලන්සරයට වතුර ගිහින් බවත්, මෙය පොල් කට්ටකින්වත් ආවරණය කිරීමේ හැකියාවක් මෙම සභාවේ සේවකයෙකුට හැකියාව තිබුනේ නැද්ද යන්නත්ය.මෙවැනි සියළු දේ බැලීමට වැඩ අධිකාරි මහතාට හැකියාවක් නොමැති බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් වන්දන මැතිතුමා පැවසුයේ ඉහත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්නේ කල් දී ඇති ප්‍රශ්නයක්ද,යෝජනාවක්ද නැතහොත් පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීමක්ද යන්න ගැටළුකාරී බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ සභා කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව කල් දී ඇති ප්‍රශ්නයකදී එක් අතුරු ප්‍රශ්නයක් පමණක් ඇසිය හැකි බැවින් මෙවැනි කාරණා කල් දී ඇති යෝජනා යටතේ ඉදිරිපත් කරන බවයි.මෙහිදී සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.මෙහිදී එතුමා PF 4006 කැබ් රථය සම්බන්ධ බිල්පතක් සම්බන්ධව ගැටළුවක් යොමු කිරීමේදි ඒ සම්බන්ධව කරුණු සාකච්ඡා කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව එම නඩත්තුව පිළිබඳව කරුණු විමසීම් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**07:07:04** බස් නැවතුම්පලේ පදික කඩ සඳහා විදුලිය ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07:05** ඉත්තගලහේන ආර්.රේණුකා මහත්මියගේ නිවස අසළ කඩා වැටී ඇති විදුලි කණු පිළිබඳව විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:08 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

**07:08:01** කහටපිටිය මාර්ගයේ කමල් මහතාගේ නිවාස මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09 ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමී මැතිතුමා**

**07:09:01** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන රු.75,000 ක මුදලින් බළන්ගොඩ ගොරොක්ගහමඩ නිවාස සඳහා නිවාස ආධාර ලබාදීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**07:10:01** බළන්ගොඩ ප්‍රධාන ව්‍යාපාරිකයන් කැඳවා බළන්ගොඩ සංවර්ධන සැලැස්ම පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10:02** බළන්ගොඩ නගරයේ මරණයක් සිදුවූ විට බළන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ පවතින ආදාහනාගාරය ඉල්ලුම් කිරීමේදී එහි මුදල වැඩි වී ඇති හෙයින් එම මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව පිළිබඳව ගරු සභාපතිතුමා පැවසුයේ මෙය සභාවට කළ නොහැකි බවයි. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කලේ මේ සම්බන්ධව ඉල්ලීමක් ප්‍රාදේශීය සභාව වෙත යොමු කරන ලෙසයි.

**07:11 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

**07:11:01** බෝම්බුව පන්සල වත්ත පාර කාණු පද්ධතිය ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:12 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා**

**07:12:01** සරස්වතී මාර්ගය දෙසින් එන කාණු පද්ධතිය සහ ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතිය හමුවන තැන තිබෙන ප්‍රමාණයට වඩා පුළුල් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:12:02** ඇල්ලෙපොල සෙනෙවිරත්න ස්ටෝර්ස් ඉදිරියෙන් කුඹුර මැද්දෙන් දිවෙන මාර්ගයට අදාළ කුඩා පාලම ඉදිකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා සලකා බැලීම**

2025-12-29 , 2026-01-16 සහ 2026-01-29 යන දිනයන්හි පැවති මුදල් කාරක සභා වාර්තා සහ 2025-12- 19 දිනැති පරිසර සහ සෞඛ්‍ය කාරක සභා වාර්තාව මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර විරෝධතා නොවූ හෙයින් එකී වාර්තා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ තමන් දෛනික වැටුප් ගෙවීමට විරුද්ධ වන බවයි.

**09.** **ආදායම් වියදම් වාර්තා සලකා බැලීම**

**2025 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.23,783,544.72 |
| මූලධන ලැබීම් | රු.4,625,446.33 |
| වෙනත් ලැබීම් | රු.6,946,824.22 |
| මුළු ලැබීම් | රු.35,355,815.27 |
| පුනරාවර්තන වියදම් | රු.18,583,131.89 |
| ප්‍රාග්ධන වියදම් | රු.692,007.89 |
| වෙනත් වියදම් | රු.5,126,392.42 |
| මුළු වියදම් | රු.24,401,532.16 |

**2026 ජනවාරි මස ඉන්ධන වාර්තාව**

| **2026 ජනවාරි ඉන්ධන වාර්තාව** | |
|---|---|
| වාහන අංකය | මුදල (රු) |
| 226-7521 | 15,067.95 |
| 227-5020 | 79,308.57 |
| 56-1906 | 31,669.01 |
| BC0005 | 33,480.00 |
| DPP0006 | 33,780.00 |
| GC0001 | 21,492.00 |
| GK1483 | 62,117.11 |
| HF7899 | 71,869.40 |
| HF8558 | 57,173.51 |
| JD4684 | 4,116.00 |
| MM 8152 | 1470.00 |
| ND5124 | 48,438.73 |
| PF4006 | 11,997.00 |
| RC 1107 | 31,837.74 |
| RC1118 | 46,479.56 |
| RD8000 | 27,800.56 |
| RD8240 | 72,788.72 |
| LL 2110 | 31,330.96 |
| ZA 5039 | 45,338.90 |
| ZA 0228 | 5978.97 |
| **Total** | **733,534.69** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10.** **පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්, 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලබා දුන් යෝජනා සඳහා අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැති බවත්, 2026 මාස දෙකක් ගත වී ඇති බවත්, මිහිඳු පෙරහැර සඳහා එම මන්ත්‍රී ප්‍රතිපාදන මුදල් ලබා දීමට යෝජනා කළද අනුමැතිය ලැබෙන විට පෙරහැර අවසන් වී තිබෙනු ඇති බවත්, එම කාර්යක්ෂම කර අදාළ අනුමැති ලබාගෙන දෙන ලෙසත්, 2026 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස වෙන් කර ඇති මුදල් සඳහා යෝජනා ලබා දිමට හැකියාවක් තිබේද යන්නත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේ පසුගියදා විවෘත කරනු ලැබූ ධීවර සංස්ථාවේ මාළු වෙළඳසැළ නීත්‍යානුකූලව අතුරුව්‍යවස්ථාවක් මඟින් සහ අනුමැතිය ලබා ගෙන කරන ලද්දක්ද යන්නත්, නගරයේ වෙනත් මාළු වෙළෙඳ ව්‍යාපාරිකයන් ඒ පිළිබඳ විමසන බවත්, නීත්‍යානුකූල නොවන ක්‍රමවේදයක් මඟින් එය විවෘත කරන ලද්දක් නම් අනෙකුත් ව්‍යාපාරිකයන් උසාවි ක්‍රියාමාර්ගවලට යනු ඇති බවත්ය.

අනතුරුව හිටපු සභාපතිවරු දෙස බැලීමේදි එක්වරම සභාපති වූ අය අඩු බවත්, එකවරම උප සභාපති වී සභාපති වීමට ගරු සභාපතිතුමාට හැකියාව ලැබුනේ යම් වාසනාවක් තිබූ නිසා බවත්, ගරු සභාපතිතුමාට ඉදිරි කටයුතු කරගෙන යාමට අවශ්‍ය සහයෝගය ලබා දෙන බවත්, එම කටයුතු සාර්ථකව සිදු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවා යන්නත්, පොදු ජන එක්සත් පෙරමුණේ සුභාසිංශන ගරු සභාපතිතුමාට ලබා දෙන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ පදික වෙළඳාමේ දීර්ඝ කාලයක් තිස්සේ නිරත වන පුද්ගලයන් කීපදෙනෙකු සිටින බවත්, ඔවුන්ව එක්වරම ඉවත් කිරීමේදී ඔවුන් කරගෙන යන ජීවිකාව අහිමි වන බවත්, නගරය පිරිසිදුව අලංකාරව තබා ගැනීම අත්‍යවශ්‍ය බවත්, එයට එකඟ වන බවත්, ඒ අනුව එම පදික වෙළඳුන්ගේ ජීවිකාව අහිමි නොකර ආර්ථිකය නඟා සිටුවීම වෙනුවෙන් පදික වෙළඳාම් කටයුතු සිදු කිරීමට වෙනම ස්ථානයක් ලබා දීම සුදුසු බවත්,ඉදිරියට පැමිණෙන්නේ උත්සව සමය බැවින් ඒ පිළිබඳව සලකා බලන ලෙසත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පැවසූයේ පදික වෙළඳාම සඳහා අවසර ලබා නොදුන්නද පසුගිය දිනෙක පිටින් පැමිණි මල් වෙළඳසැලක් ලංකා බැංකුව අසළ පැවැත්වූ බවත්, එසේ ලබා දිය හැකිද යන්නත්, ඉදිරියට පැමිණෙන උත්සව සමය වෙනුවෙන් එලෙස භූමිය ලබා දීමේ හැකියාවක් තිබේද යන්නත්ය.ගරු සභාපතිතුමා පැවසූයේ දැනට වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන්

පවතින නීතිය අනුව එලෙස ව්‍යාපාර සඳහා ලබා නොදීමේ හැකියාවක් නොමැති බවත්, වෙළඳපළක් තරඟකාරී විය යුතු බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ මාළු වෙළඳාම සම්බන්ධයෙන් සම්මත අතුරු ව්‍යවස්ථාවක් පවතින බවත්, එලෙස අතුරු ව්‍යවස්ථාවක් අවශ්‍ය නොවන බවත්, වෙළඳ ව්‍යාපාර බලපත්‍රයක් ලබා ගැනීම ප්‍රමාණවත් බවත්, තමන් පුද්ගලිකව මීට මැදිහත්වී ඇමතිතුමන්ලා සමඟ සාකච්ඡා කර බළන්ගොඩ නගරය තුළට මෙය ලබා ගත් බවත්, සමූපකාර සභාපතිතුමාට ගොඩනැගිල්ල ලබා දීම සම්බන්ධව ස්තූතිවන්ත වන බවත්, එය කාලයක් තිස්සේ මෙම නගරයේ ජනතාවට තිබූ අවශ්‍යතාවයක් බවත්, සාධාරණ මුදලකට ගුණාත්මක තත්වයෙන් මාළු ලබා ගැනීමේ වාසිය පාරිභෝගිකයාට මෙයින් ලැබෙන බවත්, මේ සම්බන්ධව තමන්ට ස්තුති කරමින් සිය ගණනක් දුරකථන ඇමතුම් ලැබුන බවත්,මේ පිළිබඳව අනෙකුත් ව්‍යාපාරිකයන්ගේ අකමැත්තක් ඇති බවත්, ඒ අනුව දැනට නගරයේ මත්ස්‍ය වෙළඳපොළ තරඟකාරී බවට පත්ව ඇති බවත් ඒ අනුව මෙය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව ලැබෙනු ඇති බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**11. අවසානය**

ගරු සභාපතිතුමා පැවසූයේ එම බළන්ගොඩ නගරයේ එම මතස්‍ය වෙළඳසැළ ආරම්භ කර මහපොළොවේ එය යථාර්ථයක් බවට පත් කිරීමට කැපවූ ගරු හිටපු සභාපති කේ.ජී පේමදාස මැතිතුමාට ස්තුතිය පුද කරන බවත්,ඒ පිළිබඳව සැහෙන අගය කිරීමක් පවතින බවත්,මෙය ගරු සභාපතිතුමාගේ මහ සභා පළමුවෙනි සභා රැස්වීම බවත්, හිටපු ගරු සභාපතිතුමාගේ කැපකිරීම සම්බන්ධව ගරු කරන බවත්, එතුමාගේ ආදර්ශය තමන්ද ලබා ගත් බවත්, බළන්ගොඩ කොට්ඨාශයේ පක්ෂය 3% වැනි අවම ඡන්ද ප්‍රතිශතයක සිට මේ දක්වා පැමිණීමට එතුමා මහත් කැපකිරීමක් කර ඇති බවත්, මන්ත්‍රී කණ්ඩායමේ සියළු දෙනා ගොඩනැගුනේ එතුමා වැනි චරිත ආදර්ශයට ගෙන බවත්, තම පක්ෂයෙ ක්‍රමය වන්නේ මෙය බවත්, තනතුරු බලාගෙන ගෞරවය අපේක්ෂාවෙන් වැඩ කිරීම නොවන බවත්, ඉදිරියට ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු සාර්ථකව සිදු කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලීම් කරන බවයි.

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තූතිය පුද කරන බවත් දන්වමින් මෙදින මහ සභාවේ කටයුතු ප.ව.1.50ට පමණ අවසන් කරන ලදි.

එන්.ඩබ්.පී.ටී ජයසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.